// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1817/24 – 2013 ජූලි 02 වැනි අඟහරුවාදා – 2013.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 216 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2012/WS/367.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 8/3/5/3/2.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජුනි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මාතලේ.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහසිය පත්තුව සුළු කොට්ඨාසයේ, උඩුගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක Ma/MTL/2013/51 හා 2013.04.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0782ක් පමණ වූ ගල්කඩුවේවත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගල්කඩුවේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0782**
උතුරට: එම්. ඒ. බී. සේනක මංජු ශ්‍රී උඩුගම හිමිකම් කියන ගල්කඩුවේවත්ත; නැගෙනහිරට: ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ගල්කඩුවේවත්ත; දකුණට: උඩුගම-මකුල්ගහරුප්ප මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය.

07 - 472

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 217 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/10/2013/යූඩීඒ/39.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මහ/ඉ/අත්/යූඩීඒ/338.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද

1A – G17890 – 425 (2013/06)
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජුනි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මහරගම.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේපත්තුව සුළු කොට්ඨාසයේ, මාකුඹුර ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක CO/MHR/2013/294 හා 2013.04.02 දිනැති පුගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 8.6638ක් පමණ වූ පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මහ කුඹුර වෙල්යාය – ප්‍රමාණය: හෙක්. 5.2715**
උතුරට: පාර, ඩබ්ලිව්. ඒ. සිරිසේන සහ කේ. ආර්. සිරිවර්ධන හිමිකම් කියන දාඹුගහවත්ත, පොදු ළිඳ, පාර, කේ. එච්. ඩී. චාන්දනී, නන්දලාල් සහ තවත් අය හිමිකම් කියන දාඹුගහවත්ත, පාර, හයිලෙවල් පාරේ වරි. අංක 323 දරන ඉඩම සහ පාර; නැගෙනහිරට: ඩබ්ලිව්. ඒ. සිරිසේන සහ කේ. ආර්. සිරිවර්ධන හිමිකම් කියන දාඹුගහවත්ත, පොදු ළිඳ, පාර, කේ. එච්. ඩී. චාන්දනී, නන්දලාල් සහ තවත් අය හිමිකම් කියන දාඹුගහවත්ත, පාර, හයිලෙවල් පාරේ වරි. අංක 323 දරන ඉඩම සහ පාර; දකුණට: හයිලෙවල් පාර, ඉඩමේ නම සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම, ප්‍රියංගනී පෙරේරා සහ තවත් අය හිමිකම් කියන මිල්ලගහවත්ත; බටහිරට: ප්‍රියංගනී පෙරේරා සහ තවත් අය හිමිකම් කියන මිල්ලගහවත්ත, ඩබ්. ඩබ්. මාලනී චන්ද්‍රලතා, සුනිල් ශාන්ත සහ තවත් අය හිමිකම් කියන කහටගහවත්ත, බී. අයි. වාලට් පෙරේරා, පී. අයි. සිරිවර්ධන, ඒ. ඩී. ප්‍රේමලාල් සහ තවත් අය හිමිකම් කියන නම සොයාගත නොහැකි ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – මහ කුඹුර වෙල්යාය – ප්‍රමාණය: හෙක්. 3.3923**
උතුරට: හයිලෙවල් පාර, හයිලෙවල් පාරේ වරි. අංක 321/2, 416, 416ඒ දරන ඉඩම් සහ මාකුඹුර සුසාන භූමිය; නැගෙනහිරට: හයිලෙවල් පාර, හයිලෙවල් පාරේ වරි. අංක 321/2, 416, 416ඒ දරන ඉඩම්, මාකුඹුර සුසාන භූමිය සහ දොලේ කඩේ මාකුඹුර පාර; දකුණට: ඩී. ඩී. කුලතුංග මාවත, ඩී. ඩී. කුලතුංග මාවතේ වරි. අංක 418/7 දරන ඉඩම, කේ. එච්. එන්. නිමලසිරි හිමිකම් කියන දෙල්ගහවත්ත සහ ඉඩමේ නම සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම; බටහිරට: ඩී. ඩී. කුලතුංග මාවතේ වරි. අංක 418/7 දරන ඉඩම, කේ. එච්. එන්. නිමලසිරි හිමිකම් කියන දෙල්ගහවත්ත, ඉඩමේ නම සහ හිමිකරු සොයාගත නොහැකි ඉඩම සහ පාර.

07 - 473

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 218 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/97/එල්ආර්බී/360.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ජීසීඑෆ්/අත්/කේඩී/23/එල්ආර්.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජුනි මස 26 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
'මිහිකත මැදුර', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුවෙල මහනගර සභා සීමාව තුල සුළු කොට්ඨාසයේ පැලවත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/කේඩීඩබ්ලිව්/2011/1114 සහ 2012.03.14 දිනැති පුගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, බී සහ කේ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 9.5068 ක් පමණ වූ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – නුගේදෙනිය, මිල්ලගහකුඹුර, නින්දකුඹුර, කජුගහකුඹුර, දිවෙලකුඹුර, ජුවන්දාරගේ කුඹුර, ඇපලවිකුඹුර, විලේකුඹුර – ප්‍රමාණය: හෙක්. 7.3482**
උතුරට: පිල්ලවත්ත, වරි. අංක 39ඒ, කේ. එල්. පෙරේරා, පාර සහ පස්වත්ත, වරි. අංක 28/1, ඒ. ජේ. එල්. ලලිතා රංජනී සහ තවත් අය; නැගෙනහිරට: පස්වත්ත, වරි. අංක 28/1, ඒ. ජේ. එල්. ලලිතා රංජනී සහ තවත් අය සහ පාර; දකුණට: මාර්ගය (ගම්සභා); බටහිරට: ඇළ.

02. **කැබලි අක්ෂර 'බී' – නුගේදෙනිය, මිල්ලගහකුඹුර, නින්දකුඹුර, කජුගහකුඹුර, දිවෙලකුඹුර, ජුවන්දාරගේ කුඹුර, ඇපලවිකුඹුර, විලේකුඹුර – ප්‍රමාණය: හෙක්. 1.5753**
උතුරට: කැබලි අක්ෂර ජේ සහ ඇළ; නැගෙනහිරට: ඇළ; දකුණට: මාර්ගය (ගම්සභා); බටහිරට: කැබලි අක්ෂර සී, ඩී, ඊ, එච්. සහ සර්දා උද්‍යානය, වරි. අංක 3/70 (5/673) සුමිත් ගුරුගේ සහ තවත් අය.

03. **කැබලි අක්ෂර 'කේ' – නුගේදෙනිය, මිල්ලගහකුඹුර, නින්දකුඹුර, කජුගහකුඹුර, දිවෙලකුඹුර, ජුවන්ද්‍රාරගේ කුඹුර, ඇපලවිකුඹුර, විලේකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.5833**

උතුරට: ඇළ; නැගෙනහිරට: කැබලි අක්ෂර ජේ; දකුණට: සර්දා උද්‍යානය, වරි. අංක 3/70 (5/673) සුමිත් ගුරුගේ සහ තවත් අය ; බටහිරට: වැව පහල යාය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

07 - 474

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1634/12 සහ 2009.12.28 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2009. අංක 318 හා 2009.12.15 දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තරව දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩමේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවමත් භාරගෙන නැත. එබැවින් ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1634/12 සහ 2009.12.28 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් 2009 අංක 318 හා 2009.12.28 දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්ඩී/05/2008/යූඩීඒ/72.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 2/2/1/107.
2013 ජුනි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', අංක 1200/6,
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්යේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහ නගර සභා සීමාව සුළු කොට්ඨාසයේ මැදගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/ගම්/08/290 සහ 2009.01.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1,2 සහ 3 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.8554ක් පමණ වන පහත නම් වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස් තුනට (3) මායිම්:

01. **කැබලි අංක 01 – පොතුවිල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.1012ක් පමණ**

උතුරට: පී. ආර්. ඒ. සම්පත් ශ්‍රී රණසිංහ හිමිකම් කියන පොතුවිල කුඹුර; නැගෙනහිරට: කැබලි අංක 3; දකුණට: කැබලි අංක 2; බටහිරට: ඔරුතොට පාර.

02. **කැබලි අංක 02 – පොතුවිල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0467ක් පමණ**

උතුරට: කැබලි අංක 3; නැගෙනහිරට: ඇළ; දකුණට: නගර සභා පාර; බටහිරට: ඔරුතොට පාර.

03. **කැබලි අංක 03 – පොතුවිල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.7075ක් පමණ**

උතුරට: පී. ආර්. ඒ. සම්පත් ශ්‍රී රණසිංහ හිමිකම් කියන පොතුවිල කුඹුර; නැගෙනහිරට: කුසුමාවතී සහ තවත් අය හිමිකම් කියන පොතුවිල කුඹුර; දකුණට: කැබලි අංක 2 සහ නගර සභා පාර ; බටහිරට: කැබලි අංක 1 සහ ඇළ.

07 - 475

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 (අ) අතුරු විධානය යටතේ ආඥාව

අංක 1809/24 සහ 2013.05.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 15 ඒ පිටුවේ පළ කරන ලද 2013 අංක 137 දරන ආඥාවේ ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය 03ජේ/94/පීසී/144 ලෙස සඳහන් වී ඇති අතර එය 03ජේ/95/පීසී/ 144 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03ජේ/95/පීසී/ 144.
2013 ජුනි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 476

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.